## 2. සන්නිවේදනයේ පදනම

**නිපුණතාව** : 2.0 සන්නිවේදනය, එහි ස්වභාවය, මූලිකාංග හා කාර්යභාරය පිළිබඳ විමර්ශනශීලී අවබෝධයෙන් යුතු ව එදිනෙද ජීවිතයේ සන්නිවේදන කාර්ය සාර්ථක කර ගැනීමේ දී භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 සන්නිවේදනය යන්න හඳුන්වා දෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** : • සන්නිවේදනය යන්න හඳුනා ගෙන අර්ථය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**
පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදනය හඳුනා ගැනීම**

- තොරතුරු හුවමාරුව සන්නිවේදනය යි.
- මානව සන්නිවේදනය මානව සමාජ සම්භවය තරම් ම පැරණි ය.
- සන්නිවේදනය දෛනික ජීවිතය හා සම්බන්ධ වූවකි.
- මානවයෙකු වශයෙන් අප සිදු කරන සිතීම, ස්පර්ශය, ආඝ්‍රාණය, දැකීම, කතා කිරීම, විඳීම, කියවීම, ලිවීම, විනෝද වීම ආදි වූ සෑම කාර්යයක් ම සන්නිවේදනය හා ඍජු ව හෝ වක්‍ර ව හෝ සම්බන්ධතාවක් දක්වයි.
- පුද්ගල හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනය යි.
- සන්නිවේදනය බිඳ වැටුණු විට ඒ හා බැඳුණු සමස්ත පද්ධතිය ම ව්‍යාකූල වේ.
- යහපත් සන්නිවේදනයක් පවතී නම් එය බොහෝ පුද්ගල-සමාජ ගැටලු අවම කර ගැනීමට හේතු වේ.
- එහෙයින් සන්නිවේදනය පිළිබඳ අවධානය යොමු කිරීම, අධ්‍යයනය කිරීම හා ප්‍රගුණ කිරීම වැදගත් ය.

- සන්නිවේදනය යන පදයේ පෘථුල අර්ථය 'දැන ගත් දේ දැන ගැනීමට සැලැස්වීම' යන්න යි.
- ඉංග්‍රීසි 'communication' යන පදය ලතින් භාෂාවේ 'පොදු බවට පත් කිරීම' යන අරුත සහිත 'communis' යන ධාතුමූලයෙන් බිඳී ආවකි.
- සිංහලයේ සන්නිවේදනය යන වචනයයෙහි අර්ථය 'මැනවින් දැනුම් දීම' යන්න යි.
- දෙමළ භාෂාවෙන් සන්නිවේදනය යන්න 'තොඩර්පාඩල් ' යනුවෙන් හඳුන්වයි. එහි අදහස ''සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලිය'' යන්න යි.
- සාමාන්‍ය සන්නිවේදන අවස්ථාවන්හි දී තොරතුරු ගැනීම සහ දීම (හුවමාරුව) සඳහා භාවිත කරනු ලබන්නේ පංචේන්ද්‍රියන් ය.
- මිනිසා නිර්මාණය කර ගත් භාෂාව හේතුවෙන් වඩාත් සංකීර්ණ අදහස් හා සංකල්ප පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව උදා විණි.
- භාෂා සම්භවය සමග අදහස් හා සංකල්ප පිළිබඳ දැනුම පුළුල් විය.
- ලේඛනය ආරම්භයත් සමඟ තොරතුරු ගබඩා කර කල් තබා ගැනීමට පදනම සකස් විය.
- සන්නිවේදන තාක්ෂණය වැඩි දියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු හුවමාරුව කඩිනම් විණි.
- ජනමාධ්‍යවල ආගමනයත් සමඟ තොරතුරු රාශියක් විශාල පිරිසක් වෙත එක වර, කඩිනමින් බෙදා හැරීමේ හැකියාව ලැබිණි.

ඇගයීම :

1. සන්නිවේදනය යන්නෙහි අර්ථය පැහැදිලි කරමින් එය හඳුන්වා දෙන්න.

**නිපුණතා මට්ටම** : 2.2 සන්නිවේදනයෙහි ස්වභාවය අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 16 යි.

**ඉගෙනුම් පල** : • සන්නිවේදනයෙහි ස්වභාවය පිළිබඳ විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**
පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදනයෙහි ස්වභාවය**

සන්නිවේදනයේ ස්වභාවය තේරුම් ගැනීමට නම් ඊට ආවේණික ගුණාංග නැතහොත් පොදු ගති ලක්ෂණ කවරේ ද යන්න විමසා බැලිය යුතු වෙයි. සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ හඳුනාගත හැකි එවැනි පොදු ගති ලක්ෂණ කිහිපයක් ඇති අතර ඒ එක් එක් ලක්ෂණය පිළිබඳ ව තරමක් විස්තර සහිත ව සාකච්ඡා කිරීම ප්‍රයෝජනවත් ය.

- සන්නිවේදනය අරමුණු සහගත ය.

  අප ඕනෑ ම අවස්ථාවක දී සන්නිවේදනයේ යෙදෙන්නේ කිසියම් අරමුණක් ඇති ව යි. තොරතුරක් ලබා දීම හෝ ලබා ගැනීම, කුතුහලය සමනය කර ගැනීම, වින්දනයක් ලබා ගැනීම වැනි කවර හෝ අරමුණක් එකී සන්නිවේදනය පිටුපස ඇති බව පැහැදිලි ය. තොරතුරු ලබා දෙන පාර්ශ්වය හා ලබා ගන්නා පාර්ශ්වය අතර මෙම අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇත්නම් සන්නිවේදනය සාර්ථක වීමට ඉඩ තිබේ. එහෙත් මේ සම්බන්ධයෙන් පරස්පරතා පවතී නම් ගැටලුකාරී තත්ත්වයන් උද්ගත විය හැකි ය.

- සන්නිවේදනය සංකේතාත්මක ය.

  සන්නිවේදනය යනු සංකේතමය ක්‍රියාකාරිත්වයකි. තොරතුරක් නැතහොත් සන්දේශයක් යනු සංකේතවලින් සමන්විත වූවකි. මේ අනුව වචන, සංඥා, ලකුණු, මුද්‍රා, ඉඟි, සිතියම්, සිතුවම්, අකුරු පමණක් නො ව ශබ්ද පවා සැලකිය යුතු වන්නේ සංකේත ලෙස ය. විවිධ වූ වස්තු, පුද්ගලයන්, ස්ථාන මෙන් ම අතිශය සංකීර්ණ හැඟීම්, අදහස්, සංකල්ප ආදිය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට අපට හැකියාව ලැබී ඇත්තේ සංකේත පදනම් කර ගෙන සිදු කරන මෙම සන්නිවේදන ගනුදෙනුව නිසා ය. සංකේත තෝරා ගැනීම ඉතා පරෙස්සමින් සිදු කළ යුතු කාර්යයකි. මන්ද සංකේත තෝරා ගැනීම වැරදුණ හොත් වෙනත් අර්ථයක් ඇති වී සන්දේශය ව්‍යාකුල වන හෙයිනි.

- සන්නිවේදනය සන්දර්භානුගත ය.

කවර හෝ සන්නිවේදනයක් සිදු වන්නේ කිසියම් සන්දර්භයක් තුළ යි. මෙමඟින් අදහස් කෙරෙන්නේ අදාළ සන්නිවේදන සිදු වන 'වටපිටාව' නැතහොත් 'පරිසරය' යි.
සන්නිවේදන කාර්යය හා සන්දර්භය අතර ඍජු සම්බන්ධතාවක් පවතී. සන්දර්භයට ගැළපෙන ලෙස සන්නිවේදන කාර්යය සකස් විය යුතු වේ. නිදසුනක් ලෙස අවමංගලෝත්සවයක් අදාළ සන්දර්භය ලෙස සලකන්න. ඊට අදාළ ව සන්නිවේදනයන් සිදු වන ආකාරය විමසා බැලීමෙන් මෙම තත්ත්වය පැහැදිලි කර ගත හැකි වේ.

මෙකී 'සන්දර්භය' යන්න හුදු භෞතික වටපිටාවට පමණක් ලඝු කළ යුතු නො වේ. මන් ද විටෙක පුද්ගලයන්, ස්ථාන, වෘත්තිය, සංස්කෘතිය වැනි දේ පවා සන්දර්භය යන්නට අඩංගු විය හැකි හෙයිනි.

- සන්නිවේදනය ක්‍රියාපටිපාටියකි.

සන්නිවේදනය කිසි විටකත් හුදෙකලා ව පවතින වෙනස් නොවන දෙයක් නො වේ. එය නිරන්තරයෙන් කාලයත් සමඟ වෙනස් වෙයි. එනිසා ම සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනය කිරීම හුදු භාණ්ඩයක් පිළිබඳ ව අධ්‍යයනය කිරීමට වඩා වෙනස් වූවකි. සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඒ හා සම්බන්ධ තවත් සාධක බොහොමයක් පිළිබඳ ව අවධානය යොමු කිරීමට සිදු වේ.

ඕනෑ ම සන්නිවේදන අවස්ථාවක කිසියම් ක්‍රියාවලියක් සිදු වේ. නිදසුනක් ලෙස ලිඛිත සන්නිවේදන අවස්ථාවක් ගනිමු. එහි දී පියවර ගණනාවක් පසු කිරීමට සිදු වෙයි. එම ක්‍රියාවලිය හා සම්බන්ධ සිතීම, සැලසුම් කිරීම, ලිවීම, සංස්කරණය කිරීම, නැවත ලිවීම ආදි විවිධ අවස්ථා ගණනකින් පසු ව යි, අවසන් ප්‍රතිඵලය වෙත එළැඹෙන්නේ. මෙසේ අන් ඕනෑ ම සන්නිවේදන අවස්ථාවක දී ඊට අනුරූප වූ ක්‍රියාවලියක් සිදු වන අයුරු නිරීක්ෂණය කළ හැකි ය.

- සන්නිවේදනය විවිධාකාර වේ.

සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ ව අවධානය යොමු කිරීමෙන් ම එහි විවිධාකාර බව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගත හැකි වේ. මේ එක් එක් සන්නිවේදන වර්ග හා ස්වරූප විවිධ වූ සන්දර්භයන්හි දී තවදුරටත් විවිධ වෙනස්කම් හා පරිවර්තනයන්ට භාජනය වන බව දක්නට පුළුවන. පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා කණ්ඩායම් සන්නිවේදනය වෙනස් වෙයි. කථන සන්නිවේදනයට වඩා ලිඛිත සන්නිවේදන ස්වරූපය වෙනස් වෙයි. කථන සන්නිවේදන ස්වරූපය ආගමික සන්දර්භයක දී එක ආකාරයකටත් දේශපාලන සන්දර්භයක දී ඊට වඩා වෙනස් ආකාරයකටත් සිදු වෙයි.

තාක්ෂණයේ ආගමනයත් සමඟ සන්නිවේදනය වෙනස්කම් රැසකට බඳුන් වූ බව පැහැදිලි ය. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හැරුණු කොට අන් සියලු සන්නිවේදන වර්ග

තාක්ෂණය නිසා කලින් කලට විවිධ පරිවර්තනයන්ට ලක් වීම වැළැක්විය නොහැකි සංසිද්ධියක් බවට පත් ව තිබේ. අප භාවිතයට ගන්නා විවිධ සන්නිවේදන විධි ක්‍රම හා මෙවලම්හි වෙනස්වීම් හා අලුත් වීම් පිළිබඳ ව පරීක්ෂාකාරී ව අවධානය යොමු කිරීමෙන් මේ බව වටහා ගත හැකි ය. සංස්කෘතිය ද සන්නිවේදනයේ විවිධත්වයට හේතු වන වැදගත් සාධකයක් ලෙස සැලකිය හැකි වෙයි. රට රටවල විවිධ සමාජයන්හි පවතින විවිධාකාර සංස්කෘති හා උපසංස්කෘතීන්හි දක්නට ලැබෙන සන්නිවේදනය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල විවිධතා පිළිබඳ සොයා බැලීමෙන් මෙම තත්ත්වය තේරුම් ගැනීමට පුළුවන. අනෙක් අතට, සංස්කෘතිය ද කාලයත් සමඟ වෙනස් වන්නකි. එකී වෙනස්කම්වලට අනුරූප ව සන්නිවේදනයේ ද වෙනස්කම් ඇති විය හැකි ය.

- සන්නිවේදනය ඒක මාර්ගික මෙන් ම ද්වි-මාර්ගික වූවකි.
  සන්නිවේදනය ගනුදෙනුවක් බව කීවෙමු. එනම් තොරතුරු ලබා ගැනීමක් හා ලබා දීමක් යන කාර්යයන් දෙක ම එහි දී සිදු වේ. මෙම ගනුදෙනුවට සම්බන්ධ වන පාර්ශ්ව දෙක ම ඊට සක්‍රිය ව දයක වීමෙන් ඉහළ ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි ය. සන්නිවේදන අවස්ථා බහුතරයක් ද්වි-මාර්ගික තත්ත්වයක් පෙන්නුම් කරන බව පෙනේ. එහෙත් ඉඳ හිට මීට වෙනස් වූ ඒක මාර්ගික සන්නිවේදනයන් සිදු වන අවස්ථා ද නැත්තේ නො වේ.

- සන්නිවේදනය බලය වේ.
  දැනුම බලය වේ යන්න ප්‍රසිද්ධ කියමනකි. දැනුම යන්න බොහෝ දුරට තොරතුරු පදනම් කොට ගත්තකි. දැනුම උත්පාදනයට තොරතුරු සන්නිවේදනය මූලික වෙයි. ඒ අනුව සන්නිවේදනය දැනුම මත ගොඩනැගෙන බලයේ පදනම සන්නිවේදනය යි. අනෙක් අතට බලය සහ නායකත්වය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. නායකයාට සිය කණ්ඩායමේ සහයෝගය අහිමි වූ දට නායකත්වය අහිමි වෙයි. එනිසා නායකත්වය ලැබීමට, දැරීමට හා රැක ගැනීමට සෙසු අයගේ පක්ෂපාතිත්වය අත්‍යවශ්‍ය වේ. ඊට අන් අයගේ එකඟතාව, අනුමැතිය හා කැමැත්ත දිනා ගත යුතු ය. ඒ සඳහා නායකයා හොඳ සන්නිවේදකයෙකු විය යුතු ය. සන්නිවේදනය බලය වන බව මෙහි දී ද තහවුරු වෙයි. ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, වාණිජ ආදි කවර ක්ෂේත්‍රයක වුව ද මෙම තත්ත්වය විද්‍යමාන වේ.

  සියලු ආකාරයේ සන්නිවේදන වර්ග 'බලය' උත්පාදනයට අවශ්‍ය පසුබිම සැකසීමට උදවු වෙයි. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය තර්කානුකූල චින්තනයේ වර්ධනයටත්, පුද්ගලාන්තර සහ කණ්ඩායම් සන්නිවේදනය පුද්ගල-මහජන සබඳතා දියුණු කිරීමටත් ජනසන්නිවේදනය ප්‍රසිද්ධිය, ජනප්‍රියත්වය භාවය හා ප්‍රතිරූප ගොඩනැගීමටත් ඍජු ව හා වක්‍ර ව දයක වෙයි. මේ සියල්ල අඩු-වැඩි වශයෙන් බලය නිර්මාණය වීමට අවශ්‍ය පදනම ශක්තිමත් ව ගොඩ නගයි.

ඇගයීම:

1. සන්නිවේදනයෙහි ස්වභාවය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
2. ඔබ කැමති මාධ්‍ය සන්දේශයක් තෝරා ගෙන සන්නිවේදනයෙහි ස්වභාවය හා බැඳුණු ලක්ෂණ එහි ගැබ් වී ඇති ආකාරය පරීක්ෂා කරන්න.

**නිපුණතා මට්ටම** : 2.3 සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 16 යි.

**ඉගෙනුම් පල** :
- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පිළිබඳ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරයි.
- සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීමට මූලිකාංග පිළිබඳ අවබෝධය අවශ්‍ය බව තේරුම් ගෙන අදහස් දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග**

සන්නිවේදනය තේරුම් ගැනීමටත් එය සාර්ථක ව ක්‍රියාත්මක කිරීමටත් එකී ක්‍රියාවලියේ අන්තර්ගත මූලික අංග මොනවා ද යන්න පැහැදිලි ව අවබෝධ කර ගැනීම අතිශය වැදගත් වූවකි. එසේ ම එකී අංග ඉහළ ගුණත්වයකින් යුතු සන්නිවේදනයක් සඳහා කෙසේ දයක වන්නේ ද යන්න පිළිබඳ ව අවධානය යොමු කිරීම ද මෙහි ලා ප්‍රයෝජනවත් ය. වඩාත් වැදගත් වන්නේ මෙකී අංග සම්බන්ධයෙන් ඉගෙන ගන්නා දෑ ප්‍රායෝගික ව එදිනෙද සන්නිවේදන අවස්ථාවන්හි දී භාවිත කිරීම යි.

සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග අතරින් වඩාත් වැදගත් වන්නේ මොනවා ද යන්න පිළිබඳ විවිධ මත තිබේ. කෙසේ නමුත් මෙහි දී ප්‍රධාන අංග 09ක් පිළිබඳ ව සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

1. සන්නිවේදකයා

   තවත් පාර්ශ්වයක් සමග තොරතුරු, අදහස්, මත, ආකල්ප ආදිය හුවමාරු කර ගන්නා තැනැත්තා සන්නිවේදකයා යි. පුද්ගලයෙකු පමණක් නො ව අවස්ථානුකූල ව කණ්ඩායමක්, සංවිධානයක්, ආයතනයක් වුව ද සන්නිවේදක ස්ථානය නියෝජනය කළ හැකි ය. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ සැලකිය යුතු මට්ටමක පාලනයක් කිරීමේ හැකියාව සන්නිවේදකයා සතු වේ.

2. ආකේතකරණය

   සෑම සන්නිවේදන ක්‍රියාවලියක දී ම සිදු වේ. මෙය මානව සන්නිවේදනය ඇසුරින් තේරුම් ගැනීම පහසු වේ. අපගේ සිතේ ඇති වන අදහස්, හැඟීම් තව අයෙකු හා සන්නිවේදනය කිරීම සඳහා සංකේත උපයෝගී කර ගනිමින් සන්දේශ බවට පරිවර්තනය කළ යුතු ය. මෙම ක්‍රියාවලිය ආකේතකරණය යි.

3. සන්දේශය

සන්නිවේදකයා අනෙක් පාර්ශ්වය සමඟ හුවමාරු කර ගන්නා තොරතුර සන්දේශය යි. එය අදහසක්, මතයක්, ආකල්පයක් වැනි විවිධ ස්වරූපයන් ගැනීමට ඉඩ තිබේ. පණිවිඩයක් හැමවිට ම සංකේත ඇසුරින් ගොඩ නැඟේ. සංකේත යන්න වචන, ශබ්ද, වර්ණ, හැඩ රූව ආදි වශයෙන් විවිධාකාර විය හැකි ය. ඒවා තෝරා ගැනීම පරිස්සමෙන් සිදු කළ යුතු වෙයි. මන් ද, සංකේත වැරදුණහොත් පණිවිඩය ද වැරදීමට ඉඩ ඇති හෙයිනි.

4. නාලිකාව/මාධ්‍යය

සන්නිවේදක ස්ථානයේ සිට අපේක්ෂිත පාර්ශ්වය වෙත සන්දේශය ගෙන යනු ලබන්නේ නාලිකාව මඟිනි. සාමාන්‍යයෙන් එදිනෙද සන්නිවේදනයේ දී භාවිත කරන නාලිකා වන්නේ පංචේන්ද්‍රිය යි. ඒ අතරින් ඇස (දැකීම) සහ කන (ඇසීම) බහුල ලෙස යොද ගැනේ. තාක්ෂණයේ ආගමනයත් සමඟ මෙකී නාලිකා/මාධ්‍යවල සිදු ව ඇති පරිවර්තනයන් හඳුනා ගැනීම අතිශය වැදගත් වේ.

5. ග්‍රාහකයා

සන්නිවේදකයා විසින් සිය සන්දේශය හුවමාරු කර ගැනීමේ අපේක්ෂාව ඇති ව එය ඉදිරිපත් කරනු ලබන්නේ කවරකු වෙත ද හේ ග්‍රාහකයා යි. ග්‍රාහකයන් විශාල ප්‍රමාණයක් ඇති විට ඒ හැම දෙනා 'ග්‍රාහක ක්ෂේත්‍රය' ලෙස හඳුන්වනු ලැබේ. සන්නිවේදන ක්‍රියාවලියෙහි දී ග්‍රාහකයා ද සන්නිවේදකයා හා සමාන වැදගත් බවක් උසුලයි.

6. විකේතකරණය

සියලු සන්නිවේදන ක්‍රියාවලියන්හි දැකිය හැකි වේ. මෙය මානව සන්නිවේදනය ක්‍රියාවලියේ දී සිදු වන ආකාරය විමසා බැලීමෙන් පැහැදිලි කර ගත හැකි ය. අප වෙත ලැබෙන සන්දේශයක් සමන්විත ව ඇත්තේ සංකේතවලිනි. එම සංකේතවලින් කියවෙන දේ අවබෝධ කර ගැනීම සඳහා සංකේත අර්ථකථනය කර ගත යුතු ය. එසේ ඉදිරිපත් වන සන්දේශයෙහි අන්තර්ගත සන්දේශ අර්ථකථනය කර එමඟින් ඉදිරිපත් කෙරෙන අර්ථය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය විකේතකරණය ලෙස හැඳින්වේ.

7. ප්‍රතිපෝෂණය

සන්නිවේදකයා සන්දේශයක් ලබා දුන් පසු ග්‍රාහකයා ඒ සම්බන්ධයෙන් සන්නිවේදකයා වෙත ලබා දෙන නිරීක්ෂණය කළ හැකි ආකාරයේ ප්‍රතිචාරය හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය යනුවෙනි. සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය සම්බන්ධයෙන් ප්‍රතිපෝෂණය අතිශය ප්‍රයෝජනවත් ය. ලැබෙන ප්‍රතිපෝෂණයට අනුව සන්නිවේදයේ ගුණාත්මක බව තවදුරටත් ඉහළ නංවාලීමට අවශ්‍ය වන පියවර ගත හැකි වේ.

තව ද ප්‍රතිපෝෂණය ධනාත්මක හෝ ඍණාත්මක විය හැකි අතර ප්‍රතිපෝෂණය ලැබීමට ගත වන කාලය අනුව එය ක්ෂණික හෝ ප්‍රමාද ප්‍රතිපෝෂණයක් ලෙස හඳුනා ගැනීමට පුළුවන.

8. ඝෝෂා/බාධා

සන්නිවේදක ස්ථානයේ සිට ග්‍රාහක ස්ථානය දක්වා සන්දේශය සම්ප්‍රේෂණය වීමේ දී ඊට අවහිර වන ලෙස මැදිහත් වන ඕනෑ ම තත්ත්වයක් ඝෝෂාවක් හෙවත් බාධාවක් ලෙස හැඳින්වේ. ප්‍රධාන බාධක වර්ග දෙකකි.

- මාධ්‍ය බාධක/නාලිකාව හා සම්බන්ධ බාධක - නාලිකාවේ හෙවත් මාධ්‍යයේ ඇති වන දෝෂ සහගත තත්ත්වයන් නිසා ඇති වේ.
- අර්ථ බාධක - සන්දේශයේ අර්ථය හරි හැටි ග්‍රහණය කර ගැනීමට නොහැකි වන විට උද්ගත වේ.

ඉහත සඳහන් ප්‍රධාන බාධක/ඝෝෂා වර්ග දෙකට අතිරේක ව තවත් කිහිපයක් සමහර පෙළ පොත්වල ඇතුළත් ව තිබේ. ඒවා නම් පාරිසරික බාධක, තාක්ෂණික බාධක, ශාරීරික බාධක, මානසික බාධක ආදිය යි. මේවා ද බොහෝ විට ඉහත සඳහන් ප්‍රධාන බාධක වර්ගවලින් එකකට අයත් වේ. උදාහරණ - තාක්ෂණික බාධාවත් නාලිකාව/මාධ්‍ය හා සම්බන්ධ බාධාත් වේ.

9. අත්දැකීම් පසුතලය

පුද්ගලයා සතු පූර්ව අත්දැකීම් සමූහය මෙමගින් අදහස් කෙරේ. සන්නිවේදක - ග්‍රාහක පාර්ශ්ව අතර සමාන ආකාරයේ පූර්ව අත්දැකීම් වැඩි ප්‍රමාණයක් ඇති විට සන්නිවේදන කාර්ය පහසු වේ.

10. සන්දර්භය

මෙමගින් අදහස් කෙරෙන්නේ අදාළ සන්නිවේදන ක්‍රියාවලිය සිදු වන්නා වූ වටපිටාව යි. සන්දර්භය පැහැදිලි ලෙස ම සන්නිවේදන ක්‍රියාවලිය මත බලපෑම් ඇති කරයි. හොඳ සන්නිවේදකයෙක් හැම විට ම සිය සන්නිවේදනය ඊට පාදක වන සන්දර්භයට උචිත ලෙස සකස් කර ගනියි. මෙසේ ඊට අනුගත නොවීම විවිධ සන්නිවේදන ගැටලුවලට හේතු විය හැකි ය.

11. බලපෑම

සෑම සන්නිවේදනයක් ම කිසියම් බලපෑමක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් සිදු කෙරේ. එකී බලපෑමේ ස්වභාවය විවිධාකාර වන්නට පුළුවන. වරෙක එය ආකල්පමය හෝ චර්යාමය හෝ වෙනසක් ඇති කිරීම ඉලක්ක කර සිදු කරන සන්නිවේදනයක් විය හැකි අතර තවත් විටෙක ලාභය වැනි මූල්‍ය ප්‍රතිලාභයක් අරමුණු කර ගත හැකි ය. කෙසේ නමුත් සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය තීරණය වන්නේ අපේක්ෂිත බලපෑම සාක්ෂාත් කර ගත්තේ ද යන්න මත යි.

**ඇගයීම :**

1. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නම් කරන්න.
2. එම මූලිකාංග වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.
3. සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා මූලිකාංග උපකාරී වන ආකාරය ප්‍රායෝගික උදාහරණ සහිත ව විස්තර කරන්න.

**නිපුණතා මට්ටම** : 2.4 සන්නිවේදනය යනු කුමක් ද යන්න නිර්වචනය කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** : • සන්නිවේදනය යනු කුමක් ද යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදනය පිළිබඳ නිර්වචන**

සන්නිවේදනය පිළිබඳ ව මූලික අවබෝධයක් ලැබීමට ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති නිර්වචන ඉතා ප්‍රයෝජනවත් ය. විවිධ විද්වතුන් හා ආයතනික සංවිධාන මඟින් ඉදිරිපත් කර ඇති සන්නිවේදනය පිළිබඳ නිර්වචන අතර සාම්‍යයක් දක්නට නොලැබුණ ද ඒවා මඟින් ඉදිරිපත් කෙරෙන මූලික සාධක පිළිබඳ ව අවධානය යොමු කිරීමෙන් සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් අර්ථවත් විවරණයක් සපයා ගත හැකි වේ.

- සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ (Harold D. Lasswell) නිර්වචනය - 1948

''යම් කිසිවෙකු, යම් කිසිවක්, කිසියම් නාලිකාවකින් යම් කිසිවෙකුට කිසියම් බලපෑමක් කිරීම සඳහා ප්‍රකාශ කරනු ලබන දෙය සන්නිවේදනය යි.''

Source: Harold D. Lasswell, '*The Structure and Function of Communication in Society*', Lyman Bryson, ed., *The Communication of Ideas* New York,Harper & Row, 1948

- සන්නිවේදනය පිළිබඳ ශැනොන් සහ වීවර්ගේ (Shannon and Weaver) නිර්වචනය -1949

''සන්නිවේදනය යනු යම් තැනක දී නිර්මාණය කර ගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන් ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීමයි''

Source: Shannon & Weaver, W. *The Mathematical Theory of Communication.* Urbana, IL: University of Illinois Press,1949

- සන්නිවේදනය පිළිබඳ විල්බර් ශ්‍රාම්ගේ (Wilbur Schramm) නිර්වචනය - 1954

''තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කොට ගෙන දෙපාර්ශ්වයක් අතර එක හා සමාන චිත්ත ස්වභාවයක් ඇති වීම සන්නිවේදනය යි''

Source: Bittner,John R., *Mass Communication: An Introduction*, U.S.A.,1986

- සන්නිවේදනය පිළිබඳ චාල්ස් එච්. කූලිගේ (Charles Horton Cooley) නිර්වචනය

  ''මානව සම්බන්ධතා රඳවා සිටින්නා වූත්, වර්ධනය කරන්නා වූත්, සියලු සංකේත මෙන් ම, ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීමටත්, කාලයේ බැඳුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත් උපකාරී වන උපක්‍රම සන්නිවේදනය යි.''

  මූලාශ්‍රය : දිසානායක, විමල්, **මානව සන්නිවේදනය**, කොළඹ, සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, 1977

- ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිර්වචනය

  ''අදහස, දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මඟින් ප්‍රදානය කිරීම, ප්‍රකාශ කිරීම හෝ හුවමාරු කර ගැනීම සන්නිවේදනය යි.''

  Source: *The Oxford Dictionary*, Eighth Edition, Oxford University, 1990

**ඇගයීම:**

1. සන්නිවේදන යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

2. සන්නිවේදනය පිළිබඳ විවිධ විෂය ක්ෂේත්‍රවල විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති නව නිර්වචන 05ක් එක්රැස් කරන්න. ඒවා මඟින් සන්නිවේදනය යන්න පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ කර ඇති විවරණ පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම** : 2.5 සන්නිවේදනයේ මූලික කාර්යයන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 18 යි.

**ඉගෙනුම් පල** : • සන්නිවේදනයේ කාර්යභාරය පිළිබඳ නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදනයේ කාර්ය**

- සන්නිවේදනය මඟින් මූලික කාර්ය 04ක් ඉටු කෙරෙන බව එය ශාස්ත්‍රීය විෂයයක් ලෙස වර්ධනය වීම ආරම්භ වූ මුල් යුගයේ සිට ම පිළිගනු ලැබිණ. එම කාර්ය 04 නම්,

    i. තොරතුරු සම්පාදනය
    ii. උපදෙස් සම්පාදනය/අධ්‍යාපනය
    iii. පෙලඹවීම
    iv. විනෝදස්වාද සම්පාදනය

- මෙම කාර්යයන් වෙන වෙන ම ගෙන සාකච්ඡාවට බඳුන් කළ හැකි නමුදු ඇතැම් විට එකිනෙක අතර සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. නිදසුනක් ලෙස උපදෙස් සම්පාදනයේ දී තොරතුරු සම්පාදනය හා විනෝදාස්වාද සම්පාදනය කාර්යන් ද සිදු විය හැකි ය. කෙසේ නමුත් මෙකී කාර්යයන් කේවල ලෙස සලකා බැලීමෙන් වඩාත් ගැඹුරින් ඒවා අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසෙයි. මෙහි දී වැඩි අවධානයක් යොමු කරන්නේ සාමාන්‍ය සන්නිවේදන තත්ත්වයන් සම්බන්ධයෙන් වන අතර ජන සන්නිවේදනය පිළිබඳ ව පසු ව සාකච්ඡා කළ හැකි ය.

**i. තොරතුරු සම්පාදනය/අධ්‍යාපනය**

සෑම සන්දේශයක් ම තොරතුරක් ලෙස සැලකිය හැකි අතර සෑම සන්නිවේදන අවස්ථාවක දී ම අඩු වැඩි වශයෙන් යම් ආකාරයක තොරතුරු සම්පාදනයක් සිදු වේ. තොරතුරු සම්පාදන කාර්යය ගුණාත්මක බවින් වඩාත් ඉහළ අගයක් ගන්නේ එකී තොරතුරුවල නිරවද්‍යතාව වඩාත් ඉහළ මට්ටමක පැවතීම මත යි.

ලිපිනයක් ලබා දීම, භාණ්ඩයක මිල ගණන් පැවසීම, රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමේ දී ජීව දත්ත පත්‍රිකාවක් ලබා දීම, මාර්ග ආලෝක සංඥා මඟින් නැවතීමට හෝ පිටත් වීමට දන්වා සිටීම ආදි වූ විවිධ අවස්ථා රැසක් තොරතුරු සම්පාදන කාර්යය හා සම්බන්ධ අවස්ථා ලෙස දැක්වීමට හැකි ය. අනෙක් අතට දුරකථන නාමාවලි, පන්ති නම් ලැයිස්තු, භූගෝලීය සිතියම්, කාටූන් වැනි දෑ මඟින් ද සිදු කෙරෙන්නේ ඉහතින් සඳහන් කළ තොරතුරු සම්පාදන කාර්යයට අදාළ ඒවා ය.

තොරතුරු සම්පාදනය විවිධ ආකාරයෙන් සිදු විය හැකි බව මේ අනුව පෙනී යයි. එසේ ම වත්මන් කාල වකවානුවෙහි තොරතුරු සම්පාදන කාර්යය බොහෝ දුරට වාණිජ මුහුණුවරක් ගත් ලාභ උපයන ක්‍රියාවලියක් බවට පත් ව තිබේ.

## ii. උපදෙස් සම්පාදනය/අධ්‍යාපනය

මෙහි දී ද තොරතුරු සම්පාදනයක් මූලික වශයෙන් සිදු වන නමුත් ඉන් ඔබ්බට ගිය ක්‍රියාකාරි ස්වභාවයක් උසුලන්නා වූ යමක් ද සිදු වෙනු දැකිය හැකි ය. එය හුදු කරුණු දැක්වීමකට සීමා නො වී ඒවායේ කිසියම් සංවිධානාත්මක හෝ අර්ථකථනාත්මක ඉදිරිපත් කිරීමක් පෙන්නුම් කරයි. පරිගණකයක් භාවිත කර ලිපියක් සකස් කර ගන්නේ කෙසේ දැ යි ඔබ තවත් අයෙකු දැනුවත් කිරීම නිදසුනක් ලෙස ගනිමු. එය උපදෙස් සම්පාදනයකි. ඔබ එහි දී පරිගණකය සම්බන්ධ මූලික තොරතුරුවලට අමතර ව එම කාර්ය සිදු කරන අයුරු, ඊට සම්බන්ධ විවිධ මෙවලම්වල, ක්‍රියාකාරීත්වය ආදිය පැහැදිලි කරමින් සංවිධානාත්මක ඉදිරිපත් කිරීමක නියැලෙන්නෙහි ය. එය තොරතුරු සම්පාදනයෙන් ඔබ්බට ගිය උපදෙස් සම්පාදනයක් නැතහොත් අධ්‍යාපන කාර්යයක් වන්නේ එහෙයිනි. දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ, පෙළ පොත් ආදිය මඟින් මූලික වශයෙන් සිදු කරනුයේ අධ්‍යාපන කාර්යයක් බව මේ අනුව පැහැදිලි විය යුතු ය.

## iii. පෙලඹවීම

සමහර සන්දේශ මඟින් යමෙකු සිතන පතන ආකාරයේ හෝ කටයුතු කරන ආකාරයේ වෙනසක් සිදු කිරීම අරමුණු කරයි. එනම් ආකල්පමය හෝ චර්යාමය වෙනසක් ඇති කිරීම යි. මෙය පෙලඹවීම් කාර්ය යි. එදිනෙදා විවිධ කටයුතු සඳහා තවත් පාර්ශ්වයක සහභාගිත්වය අවශ්‍ය වන අවස්ථාවල දී අපට ඒ අය ඒ සඳහා පොලඹවා ගැනීමට සිදු වේ. පෙලඹවීමේ කාර්යය අරමුණු කරගත් සන්දේශ බොහෝ විට සිතාමතා සැලසුම් සහගත ව සකස් කරනු ලබයි. කථනය, ලේඛනය, රූපමය ඉදිරිපත් කිරීම් ආදි විවිධ වූ උපාය-උපක්‍රම මේ සඳහා යොදා ගත හැකි වේ. එමෙන් ම අවශ්‍යතාව, අවස්ථාව, අදාළ බව වැනි ආනුෂංගික අනෙකුත් වැදගත් සාධක පිළිබඳ ව ද අවධානය යොමු කරමින් වඩාත් සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම මත මෙම සන්දේශවල සාර්ථකත්වය රඳා පවතී. නිදසුන් ලෙස වෙළෙඳ දැන්වීම් දැක්විය හැකි ය.

## iv. විනෝදාස්වාද සම්පාදනය

සන්නිවේදන කාර්යයන් අතර විනෝදාස්වාද සම්පාදනය ද වැදගත් වූවකි. සන්නිවේදනය සමඟ විනෝදය එකතු වූ විට එය වඩාත් සිත්ගන්නා වූ අත්දැකීමක් බවට පත් වේ. ඉහතින් දක්වන ලද කවර සන්නිවේදන කාර්යයක් වුව ද ආකර්ෂණීය ලෙස හා ආයාසයකින් තොර ව සිදු කිරීමට විනෝදාස්වාදය යොදා ගත හැකි ය. සන්නිවේදන අවස්ථාවට උචිත ලෙස හාස්‍ය මුසු කර ගැනීමේ අපූරු කුසලතාව හොඳ සන්නිවේදකයෙකු සතු ව නිතැතින් ම පවතී. දෙදෙනෙකු අතර සංවාදයක දී, පිරිසක් අමතා කරන දේශනයක දී මෙන් ම ලිඛිත සන්නිවේදන අවස්ථාවක දී පවා මෙම කුසලතාව අතිශය ප්‍රයෝජනවත් ය. අතිශය කාර්ය බහුල, ආතතියෙන් පිරි ජීවිතයක් ගත කරන වත්මන් සමාජයේ සාමාජිකයන්ට මෙය එක්තරා අයුරකින් ඉහිල් වීමක් හා සැහැල්ලුවක් ගෙන දෙන්නකි. කෙසේ නමුත් සන්නිවේදනයේ දී මෙහි සීමාවන් පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කිරීම ද වැදගත් ය.

- ජනමාධ්‍ය බිහි වීමත් සමඟ සන්නිවේදන ක්‍රියාවලිය තව තවත් පුළුල් විය. විශාල පිරිසකට එක වර තොරතුරු සන්නිවේදනය කිරීමට මේ නිසා හැකි විය. පහත දැක්වෙන්නේ ඉහත දැක් වූ කාර්යයන්ට අමතර ව ජන සන්නිවේදනයට ම විශේෂිත වූ කාර්යයන් ය. හතර වන පාඩමේ ජනමාධ්‍ය පිළිබඳ විග්‍රහ වන අවස්ථාවේ මෙම කරුණු පිළිබඳ වැඩි දුර විස්තර ඇතුළත් වේ.

i. සුපරීක්ෂණය
ii. අර්ථකථනය
iii. සහසම්බන්ධය
iv. සමාජානුයෝජනය

ඇගයීම :

1. සන්නිවේදනය සතු කාර්යභාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**පාරිභාෂික පද**

| | |
|---|---|
| අත්දැකීම් පසුතලය | - Frame of Experience |
| අධ්‍යාපනය | - Education |
| අර්ථකථනය | - Interpretation |
| ආකේතකරණය | - Encoding |
| කාර්යය | - Funtion |
| ග්‍රාහකයා | - Receiver |
| ඝෝෂා/බාධා | - Noise |
| තොරතුරු | - Information |
| නාලිකාව | - Channel |
| නිර්වචනය | - Definition |
| පෙලඹවීම | - Persuasion |
| ප්‍රතිපෝෂණය | - Feedback |
| බලපෑම | - Effect |
| විකේතකරණය | - Decoding |
| විනෝදාස්වාදය | - Entertainment |
| ස්වභාවය | - Nature |
| සන්දර්භය | - Context |
| සන්දේශය | - Message |
| සන්නිවේදකයා | - Communicator |
| සමාජානුයෝජනය | - Socialization |
| සහසම්බන්ධය | - Correlation |
| සුපරීක්ෂණය | - Surveillance |

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. දිසානායක, විමල්, **මානව සන්නිවේදනය**, කොළඹ සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, 1977

2. Bittuer, John R. *Mass Communication: An Introduction,* U.S.A, 1986

3. Charles, Wright R., *Mass Communication*, New York, 1971

4. Dominic, Joseph, R., Dhynamic of Mass communication, USA, Maee Grow: Hill (Publisher) 2010

5. James Waston and Anne Hill, *A Dictionary of Communication and Media Studies*, India, Universal book stall, 1991

6. Narula, Uma, *Mass Communication Theory and Practice*,New Delhi, 1994